Mathematics.lk
FOR FUTURE EDUCATION IN SRI LANKA

Sri Lanka First and Only Mathematics Educational Website

Visit Our Website for More;

© LAHIRU KADURUGAMUWA EDUCATIONAL FOUNDATION

11782

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) යාපනය, ගම්පොළ, හම්බන්තොට, කැලණි ගඟ, රංචාමඩම, නාච්චදූව වැව, මාතලේ, දඹකොළපටුන, මින්නේරි වැව, මඩකලපුව, පාහියන්ගල, මන්නාරම (ලකුණු 12)

(ii) ගෝව, සුවස් ඇළ, මලය අර්ධද්වීපය, ඉස්තාන්බුල්, තායිවානය, බ්‍රිතාන්‍යය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - කුඩා රාජ්‍ය එකතුකොට ජර්මනිය බිහිකළ පාලකයා
B - පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට චේර රාජ්‍යයට ගිය ලම්බකර්ණ වංශික පාලකයා
C - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නම් උපාධි නාමයෙන් පිදුම් ලද රජතුමා
D - එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටු වීමට මුල් වූ බ්‍රිතාන්‍ය අගමැතිවරයා

(ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



A රූපය

(ii) (1) A රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
(2) ජනතා සුභසිද්ධිය පිළිබඳ තොරතුරු සපයන මොහුගේ ප්‍රකට ග්‍රන්ථය කුමක් ද?
(3) එම ග්‍රන්ථය මගින් ඉදිරිපත් කොට ඇති සංකල්පය කුමක් ද?
(4) මොහුගේ අදහස් තුළින් පෝෂණය වූ විප්ලවය කුමක් ද?
(ලකුණු 04)



B රූපය

(iii) (1) B වලින් දැක්වෙන ගොඩනැගිල්ල නම් කරන්න.
(2) එය නිර්මාණය කරවීමට දායකවූ රජුගේ නම ලියන්න.
(3) මෙය පිහිටා ඇත්තේ කුමන නගරයක ද?
(4) මෙය අයත්වන ගෘහ නිර්මාණ වර්ගය කුමක් ද?
(ලකුණු 04)

## II කොටස

(02) (i) ප්‍රාග් ඓතිහාසික යුගයට අදාළ තොරතුරු ලබාදෙන අර්ධ ශුෂ්ක කලාපයට අයත් ස්ථාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා තම වාසස්ථාන තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ කරුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) a. මුල් ඓතිහාසික යුගය වශයෙන් හඳුන්වන්නේ කුමන කාල පරිච්ඡේදයක් ද?

b. එම යුගයේ වෘත්තීන් අනුව බිහිවූ ගම් තුනක් නම් කරන්න. (ලකුණු 05)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාව සකස්ව තිබූ ආකාරය කරුණු තුනක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් රාජත්ව සංකල්පවලින් හැඳින්වූ රජවරු තිදෙනා නම් කරන්න.

A. දේවත්ව B. නරේශ්වර C. චක්‍රවර්ති (ලකුණු 03)

(ii) පහත ABCD වලින් දැක්වෙන කාර්යයන් භාරවූ නිලධාරීන්ගේ තනතුරු නාම අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. භෝජනශාලා කටයුතු B. වෙළඳ කටයුතු

C. වත්සිරිත් චාරිත්‍ර D. අශ්ව අංශයේ ප්‍රධානත්වය (ලකුණු 04)

(iii) පරුමකවරයකු බිහිවීම සඳහා බලපෑ හේතුව සඳහන් කොට පරුමකගේ කාර්යයන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දුටුගැමුණු රජු මෙරට බිහිවූ ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව කරුණු තුනක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සඳහන් ඇළමාර්ග නිර්මාණය කරවූ රජවරුන්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න

A. මිනිපේ ඇළ B. යෝධ ඇළ C. ඇළහැර ඇළ (ලකුණු 03)

(ii) පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ නිර්මාණ අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. උස් ගොඩනැඟිලි අකුණු සැරවලින් ආරක්ෂා කර ගැනීමට යෙදීම -

B. පානීය ජලයේ ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම -

C. මැටි බඳුන් ක්‍රමවත්ව සකස් කර ගැනීමට උපකාර කර ගැනීම -

D. ජලය මුදා හැරීමේ දී වැව්බැම්මට සිදුවන පීඩනය අවම කර ගැනීම - (ලකුණු 04)

(iii) වැව් බැම්ම ශක්තිමත් කර ගැනීම සඳහා පුරාණ වාරි ශිල්පීන් අනුගමනය කළ ක්‍රම ශිල්ප දෙකක් උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ගෘහ නිර්මාණ කටයුතුවල දී අතීත ශිල්පීන් දැක්වූ කුසලතාවය පිළිබඳ කරුණු තුනක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසු ආරක්ෂිත ස්ථානවල නව පාලන මධ්‍යස්ථාන පිහිටුවාගත් පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත ABCD හි දැක්වෙන තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - චන්ද්‍රභානු ජාවකගේ ආක්‍රමණවලට මුහුණ දුන් රජු -

B - දැදිගම පරාක්‍රමබාහු රජුගේ සහෝදරිය විවාහ කරගත් ප්‍රභූවරයා -

C - සයවන බුවනෙකබාහු නමින් රජවූ කුමරයා -

D - කෝට්ටේ රාජධානියේ ආරම්භක පාලකයා -

(අම්බුලුගල, පරරාජසේකරම්, සේනාධිලංකාර සෙනෙවිරත්, දෙවන පරාක්‍රමබාහු, සපුමල්, විජය කුලංකෙත, තුන්වන විජයබාහු, නිශ්ශංක අලගක්කෝනාර) (ලකුණු 04)

(iii) ගම්පොළ රාජධානයේ ස්වාධීනත්වයට හානි කර වූ දේශීය හා විදේශීය ආක්‍රමණ සිදුවූ බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දඹදෙණි රාජධානියේ තුන්වන විජයබාහු රජු ගේ රාජ්‍ය කාලයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට පැවති රාජධානි තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි ජාතිකයා

B - බලන සටන මෙහෙයවූ පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා

C - වර්ෂ 1519 යාපනයේ පාලනය බාරගත් පෘතුගීසි ගැති පාලකයා

D - සිරමැදිරියෙන් මිදී පස්දුන්රට පැළෑද ප්‍රදේශයට පලාගිය කෝට්ටේ ප්‍රභුවරයා

(ලකුණු 04)

(iii) කෝට්ටේ හා සීතාවක පාලකයින්ට පෘතුගීසි බලය මැඩලීමට නොහැකි වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) සීතාවක රාජධානියේ පරිහානියට බලපෑ හේතු තුනක් සඳහන් කොට ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් නම් කරන්න.

A - වර්ෂ 1908 යටත් විජිත ලේකම්ට විධිමත් පෙත්සමක් ඉදිරිපත් කිරීම

B - උදයභානු පුවත්පත ආරම්භ කිරීම

C - මධ්‍යසාර භාවිතයෙන් සිදුවන විපත නාට්‍ය මගින් දැනුවත් කිරීම (ලකුණු 03)

(ii) පහත දැක්වෙන දේශපාලන යෝජනා ඉදිරිපත් වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වරහන් තුළින් තෝරා ABCD අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම

B - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයින් කාරකසභා හතකට පත් කිරීම

C - ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

D - සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම

(ඩොනමෝර්, 1978 ප්‍රතිසංස්කරණ, කෝල්බෲක්, මැනිං, සෝල්බරි, 1972 ප්‍රතිසංස්කරණ)

(ලකුණු 04)

(iii) වර්ෂ 1848 සිදුවූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ද හේතු වූ බව කරුණු දෙකක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ වී වගාව දියුණු කිරීම සඳහා නිදහසින් පසු ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පුනරුද සමයේ සාහිත්‍ය සේවාවට දායක වූ එංගලන්ත ගත් කතුවරුන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පුද්ගලයින්ගේ නම් ලියන්න.

A - අවසාන භෝජන සංග්‍රහය චිත්‍ර කලා කෘතියේ නිර්මාණකරුවා

B - පිලිපීනයේ දී ජීවිතක්ෂයට පත්වූ දේශගවේෂකයා

C - බ්‍රහස්පති ග්‍රහයාගේ උපග්‍රහයින් සොයාගත් පුද්ගලයා

D - පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ ජර්මන් ජාතික මහාචාර්යවරයා (ලකුණු 04)

(iii) මධ්‍යතන යුගය අවසන්කොට යුරෝපා පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපා පුනරුදයේ බලපෑම ශ්‍රී ලංකාවට ද ලැබුණු බව කරුණු තුනක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) පළමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මධ්‍යම බලවතුන්ගේ පිලේ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ තොරතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු ජර්මනියට දඬුවම් පැමිණ වූ ගිවිසුම

B - ඇඩොල්ෆ් හිට්ලර් සිරගතව සිටියදී ලියන ලද කෘතිය

C - දෙවන ලෝක සංග්‍රාමයේ දී ජපානයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති

D - වර්ෂ 1936 දී මුසොලිනී විසින් ආක්‍රමණය කරන ලද අප්‍රිකානු රට (ලකුණු 04)

(iii) පළමුවන ලෝක සංග්‍රාමයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ලෝක සාමය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ආරම්භ වූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)